**ශීර්ෂය 265- මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව හා භාණ්ඩාගාරයේ මුළු වියදම් වාර්තාව අනුව පුනරාවර්තන වියදම්වල හා මූලධන වියදම්වල රු.244,770 බැගින් නොසැසඳුණු වෙනස්කම් පැවතිණි. | ඉදිරියේදී මෙවැනි ක්‍රියා සිදු නොවන පරිදි කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. | ගිණුම් ප්‍රකාශවල වූ සංඛ්‍යා, උපයෝගී තොරතුරු සමඟ සසඳා නිවැරදි ශේෂ ගිණුම්වල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ආ) මූලධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ වියදම් රු.5,819,399ක් සහ වර්ග අඩි 2625ක් වූ දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ වූ ගොඩනැගිලි වටිනාකමක් මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | මූලධන වියදම් පිළිබඳ දෝෂ මහා භාණ්ඩාගාරය සමග සාකච්ඡා කිරීමටත්, ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමටත් ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| භාණ්ඩාගාරය විසින් රු.53,744,588ක අග්‍රිම නිකුත් නොකිරීම නිසා අනුමත මූලධන ප්‍රතිපාදන උපයෝජනය කළ නොහැකිව පැවතිණි. | අග්‍රිම නොලැබීම නිසා මූල්‍ය ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම උපයෝජනය කළ නොහැකි විය. | ලද අග්‍රිම ප්‍රශස්ත ලෙස උපයෝජනය කළ යුතුය. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 21 ක ප්‍රතිපාදන ඉතිරි වීම් රු.72,757,322 ක් වූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 06 ත් සියයට 100 ත් අතර පරාසයක විය. | අවශ්‍ය අග්‍රිම ලැබී නොතිබීම, ප්‍රතිපාදන ඉතිරියට හේතු වී තිබුණි. | ලද අග්‍රිම ප්‍රසස්ත ලෙස උපයෝජනය කළ යුතුය. |
| (ආ) වැය විෂයන් 06 ක් සඳහා වෙනත් වැය විෂයයන්ගෙන් ප්‍රතිපාදන මාරු කරගත් ප්‍රතිශතය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 38 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | ඉදිරියේදි නිවැරදිව අයවැය සකස් කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | ඇස්තමේන්තු නිවැරදිව සැලැසුම් කළ යුතුය. |
| (ඇ) වැය විෂයයන් 05ක් වෙත වෙනත් වැය විෂයයන්ගෙන් රු.5,780,000 ක ප්‍රතිපාදන මාරුකර තිබුණද, 2021 දෙසැම්බර් 31 දිනට එම වැය විෂයයන්ගේ ප්‍රතිපාදන ඉතිරි වීම් රු.5,911,492 ක් විය. | අවශ්‍ය අග්‍රිම ලැබී නොතිබීම, ප්‍රතිපාදන ඉතිරියට හේතු වී තිබුණි. | -එම- |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 43ක් විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මූලධන වැය විෂයයන් සඳහා ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.110,113,823 ක් හෙවත් සියයට 09 ත් සියයට 100 ත් අතර පරාසයක ඉතිරි වීම් පැවතිණි. ඒ තුළ පැවැති මුළු ප්‍රතිපාදනයම ඉතිරි වීම් වටිනාකම රු.21,681,260 ක අගයක් ගෙන තිබුණි. | රටෙහි ඇති ව තිබුණු මූල්‍ය අර්බුදය, උද්ධමනය, ගමනාගමන අපහසුතා, අග්‍රිම නොලැබීම ආදී හේතු නිසා ප්‍රතිපාදනවල ඉතිරි වීම් පැවැතිණි. | ලද අග්‍රිම ඵලදායි ලෙස උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**
-------------------------------

**3.1 ප්‍රසම්පාදනය**
-------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තාක්ෂණික උද්‍යානයක්, වාහන නැවැතුම් පොලක් සහ ශ්‍රවනාගාරයක් ඉදි කිරීම සඳහා රු. 50,000,000ක ප්‍රතිපාදන සලසා තිබුණද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2.1 පරිදි විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැසුමක් සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2.3 පරිදි ප්‍රසම්පාදන කාලසටහනක් සකස් කර නොතිබුණි. | මෙවැනි දෝෂ ඉදිරි කාලයේදී සිදුනොවීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ක්‍රියාත්මක කළ යුතුය |

**3.2 වත්කම් කළමනාකරණය**
-------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන 03 ක්, ට්‍රැක්ටරයක්, ට්‍රැක්ටර් ට්‍රේලර් සහ යතුරු පැදි 12 ක් දීර්ඝ කාලයක සිට අභාවිතව පවතී. | ලියාපදිංචි සහතිකය නොතිබීම මූලික හේතුව විය. එය ලබාගැනීමට පියවර ගනිමින් පවතී. | වත්කම් භාවිතයට ගැනීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් නොපමාව ගතයුතුය. |

**3.3 පාඩු හා හානි**
---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂයේදී ඉදිකළ නේවාසිකාගාරයක් වෙනුවෙන් රු.217,994 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවූ මුදල් අයකර ගැනීමට පියවර ගෙන ඇත. | වැඩිපුර ගෙවීම් අයකරගත යුතුය. |
| (ආ) නිවැරදිව සැලැසුම් සකස් කර කාර්යයන් ඉටු නොකිරීම නිසා දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල නැවත වෙනස් කිරීමට සිදු වීමෙන් රු.250,220 ක පාඩුවක් සිදු වී තිබුණි. | සුදුසු ඉඩකඩ නොමැති වීම විශාල ගැටළුවකි. මේ නිසා බිම් මහල කාර්යාල සඳහා භාවිතා කිරීමට ප්‍රගති සමාලෝචන රැස්වීමේදි අනුමත කර තිබුණි. | ව්‍යාපෘති විධිමත්ව සැලැසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.4 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මාන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ විලාංකුලි ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුළ නිවාස ඉදිකර ගැනීමට 2015 වර්ෂයේදී ප්‍රතිලාභීන් දෙදෙනෙකුට රු.1,000,000ක් ලබා දී තිබුණ ද, එම නිවාසවල ඉදි කිරීම් සම්පූර්ණ කර නොතිබුණු අතර ප්‍රතිලාභීන් එම නිවාසවල පදිංචි වී නොසිටියහ. | අදාළ කාර්යයන් නිම කිරීම හෝ ලබාදුන් මුදල් රජයේ ගිණුමට තැන්පත් නොකරන්නේ නම් හෝ අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවට දැනුම් දී ඇත. | අදාළ ඉදි කිරීම් සම්පූර්ණ කිරීමට හෝ ලබා දුන් මුදල් නැවත අයකර ගැනීමට හෝ නොපමාව පියවර ගත යුතුය. |

## 3.5 මෙහෙයුම් දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ වූ ඉදිකිරීම් වෙනුවෙන් 2022 ජූනි 20 දිනට රු.72,565,061 ක් ගෙවා තිබුණ ද, සම්පූර්ණ ඉදි කිරීමට අදාළ ඇස්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය, වාස්තු විද්‍යාත්මක හා ව්‍යුහාත්මක සැලසුම් (Architectural and Stuctural Drawings) ආදී කිසිවක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදි මෙවැනි දෝෂ වැළැක්වීමට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මගින් විශාල මූලධන කාර්යයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. | නීතිරීති හා තාක්ෂණික උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය තුළ වාහන අනතුරු 02 කින් සිදු වූ රු.1,565,125 ක හානිය, හානි හා පාඩු ලේඛනයේ සටහන්ව නොතිබුණු අතර මුදල් රෙගුලාසි 104(1) අනුව පරීක්ෂණ සිදුකර වගකීම නිශ්චය කර නොතිබුණි. | නැවත මෙවැනි දෑ සිදු නොවීමට උපදෙස් ලබා දී ඇත. මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා 667 ක් වූ අනුමත කාර්ය මණ්ඩලයෙන් 2022 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු 162 ක් පැවැතුණි. | පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය විසින් කටයුතු කරමින් පවතී. | අවශ්‍යතාව පරිදි පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුය. |